# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2018 ජනවාරි මස 09 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.12.05 දින අසන ලද ප්‍රශ්නය;

[ප්‍ර/VI(1)/17/112]

අ. මීගමුව මහ නගර සභාව මගින් පාලනය වන සාප්පු සංකීර්ණය අවට මීට අවුරුදු 3 කට පෙර ක්‍රියාත්මක වූ රථවාහන සැලැස්ම විධිමත් ලෙස පැවති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. එකී සැලැස්ම අනුව විශේෂ අවස්ථාවල පමණක් එක් තීරුවක රථ වාහන ගමන් කිරීමට ඉඩ සැලැස්වූ බව ඔබතුමා දන්නෙහිද?

ඇ. මේ වන විට කිසිදු අයකුට නොදන්වා එකී සාප්පු සංකීර්ණයේ එක් පසෙකට පමණක් රථ වාහන ගමන් කිරීමට ඉඩ සලස්වා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඈ. අදාල ව්‍යාපාරිකයන්ට හා නිලධාරීන්ට නොදන්වා එකී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල අයට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

ඉ. ව්‍යාපාරිකයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පෙර පරිදි ක්‍රියාත්මක වූ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.12.05 දින අසන ලද ප්‍රශ්නය; [ප්‍ර/VI(1)/17/117]

අ. සීමාසහිත 532/සී වත්තෙගෙදර ස.ණ.ස. සමිතියේ මුදල් අක්‍රමිකතාවයට අදාළ විනය පරීක්ෂණ අවසන් වීද?

ආ. අවසන් වී නැතිනම් හේතු කවරේද?

ඇ. මෙතෙක් කළ පරීක්ෂණවලට අනුව සම්පූර්ණ විස්තර ඇතුළත් වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඈ. එම වාර්තාව පදනම් කර ගනිමින්, අක්‍රමිකතා සිදු වී ඇති ආකාරය ගැන හෙළි වී ඇති කරුණු මොනවාද?

ඉ. අදාළ සමිතියේ කටයුතු අත්හිටුවීමෙන් පසුව එකතු කරගෙන ඇති මුදල්වල වටිනාකම කීයද?

ඊ. තම අයිතිවාසිකම වෙනුවෙන් පෙනී සිටින තැන්පත්කරුවන් සඳහා එම මුදල් සාධාරණ ක්‍රමයකට බෙදා දීමට කටයුතු කරන්නේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

**03.** **ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;** [ප්‍ර/VI(1)/17/120]

(අ) කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 204 බී, ග්‍රාම නිලධාරී වසම තුල මාර්ග අංක 244, සිදුව කොටුගොඩ මහා මාර්ගයත්, ජා ඇල මීනුවන්ගොඩ මහා මාර්ගයත් සම්බන්ධ වන පරිදි මාර්ගයක් සඳහා මාර්ග රක්ෂිතයක් තිබෙන බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එකී මාර්ග රක්ෂිතයේ යම් ප්‍රමාණයක් මාර්ගයක් සඳහා භාවිතා කළ ද,තවත් කොටසක් අනවසරයෙන් ඉදිකිරීම් සිදු කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) කටාන ප්‍රාදේශීය ලේකම් විසින් කටා/217/09 ගොනු අංකය යටතේ 2017.07.05 වන දින එකී මාර්ග රක්ෂිතය, මැනුම් නියෝගයක් ලබාගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බවත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් කටා/217/345 ගොනු අංකය යටතේ මාර්ග රක්ෂිතයේ මායිම් ලකුණු කර ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බවත්, ඔබතුමා දන්නෙහිද?

(ඈ) එකී මාර්ග රක්ෂිතය මායිම් ලකුණු කිරීමෙන් පසු කිසියම් පිරිසක් විසින් බිම් කොටස 99 අවුරුදු බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට කටයුතු කරන බව ඔබතුමා දන්නෙහිද?

(ඉ) එකී මාර්ග රක්ෂිතය භාවිතා කරමින් විකල්ප මාර්ගයක් ලෙස ඉදි කරන්නේ නම් 'මිලේනියම් සිටි', 'නිවාසි පුර', ඒකල, 'මිඩ්ලන්ඩ් වත්ත' වැනි නගර වලට යා හැකි බව ඔබතුමා දන්නෙහිද?

## VI. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
## VII. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්
## IX. පොදු කටයුතු

**01.** **ගරු සුමිත්ලාල් මැන්ඩිස් - සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටුයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.):**

**යෝජනාව :**

"බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය - පටිපාටි රීති"

"2017.11.07 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට පිළිගන්වන ලද 'බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය - කෙටුම්පත' පිළිබඳව සාකච්ඡා කර අනුමත කළ යුතුය."

[2017.11.14 දින පැවැති සභා රැස්වීම හි වැඩ කටයුතු හා සම්බන්ධිතයි.]

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:**

" බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක 2 ට අයත් ප්‍රදේශයක පිහිටා ඇති බොල්ගොඩ ගඟ ලෙසත් වැව ලෙසත් හඳුනන තෙත් බිම් පද්ධතිය පළාතේ සංවර්ධනයට යොදා ගත හැකි වටිනා සම්පතකි. ආර්ථික හා පාරිසරික වටිනාකමක් ඇති මෙම තෙත් බිම් පද්ධතිය වර්තමානය වන විට නොයෙක් විනාශයන්ට ගොදුරු වූ මානව සංවර්ධනයට සම්බන්ධ නොවන කිසිදු පරිපාලන ආයතනයක සෘජු සංවර්ධනයකට දායක නොවුනු අත්හැර දමන ලද සම්පතක් බවට පත් වී ඇත. මිරිදිය ධීවර කර්මාන්තය, පළාත් සංචාරක ව්‍යාපාරය, භාණ්ඩ ප්‍රවාහනය, තෙත් බිම් ආශ්‍රිත ඖෂධීය හා කෘෂි ආර්ථික තත්ත්වයන් පෝෂණය කර ගැනීම යනාදි වටිනා සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි මෙම පරිසර පද්ධතිය පිළිබඳව පුළුල් විද්‍යාත්මක සමීක්ෂණයකින් පසුව පරිපාලන ආයතන ඒකාබද්ධ කරගත් බොල්ගොඩ තෙත් බිම් පද්ධතිය උදෙසා සංවර්ධන වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි. "

[යෝ/VI(1)/17/08]

**02. ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මන්ත්‍රීතුමා:**

" ශ්‍රී ලංකාව තුල විවෘත ආර්ථික වෙළඳපොළ හඳුන්වාදීමත් සමඟ පරිභෝජනවාදය සීඝ්‍රයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බැහැර කරන කැලිකසළ ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළ ගියේය. එසේ බැහැර කරන කැළිකසල වල දිරාපත් නොවන ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල වශයෙන් එක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දිරාපත් වන කසළ දිරාපත්වීම ප්‍රමාදවීමට මෙය හේතු වූ අතර, පරිසරයටත්, සමාජයටත්, මානව පැවැත්මටත් වෙනත් සත්ත්ව කොටස් වලටත් බහුවිධ බලපෑමක් එක්කළ අතර, දිරාපත් නොවී කුණු කඳු ගොඩගැසීම නිසා විශාල ඛේදවාචකයක් සහ ජීවිත හානි ද සිදුවිය.

කසළ බැහැර කිරීමට, දිරාපත්වීමට, ප්‍රතිචක්‍රීකරණයට හා කොම්පෝස්ට් නිෂ්පාදනයට ලන්ච්ෂීට්, සිලිබෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල ප්‍රමාදයක් හා බාධකයක්, ව්‍යසනයක්, ඇති කරන බැවින් ඒවා නිෂ්පාදන කිරීම, විකිණීම හා භාවිතය, තහනම් කරමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ගනු ලැබූ තීරණය රටේ අනාගතය, අනාගත පරපුර හා පරිසරය සම්බන්ධ ඵලදායි ප්‍රතිපත්ති තීරණයක් ලෙස පැසසුමට හා අගය කිරීමට ලක්කරන අතර රට වෙනුවෙන් මෙම පොලිතින් තහනම ක්‍රියාත්මක කිරීමටත් ඊට අදාල නීතිය ක්‍රියාත්මක කිරීමටත්, බස්නාහිර පළාත් සභාවේ සහය පළ කළ යුතු යැයි යෝජනා කරමින්, මෙම ප්‍රතිපත්ති කවර බලපෑමක් නිසාවත් ආපස්සට නොහැරවිය යුතු යැයිද, පරිසර හිතකාමී විකල්ප ආදේශන ප්‍රවර්ධනය කිරීමටත්, ජනගත කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි. "

[යෝ/VI(1)/17/09]

## XI. සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2017.12.20 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.